**මඩකලපුව මහනගර සභාව - 2017**
**මඩකලපුව දිස්ත්‍රික්කය**
**---------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**-----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**--------------------------------**

2017 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 23 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර ඒ පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 13 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදී.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**-------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර,මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනටමඩකලපුව මහනගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**----------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
**------------------------**

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භයට ඉදිරියට ගෙන එනු ලැබූ රු.52,402,332 ක් වටිනා ගබඩා තොග සඳහා භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර එහි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. මේ හේතුවෙන් ගබඩා තොගයේ සත්‍ය වටිනාකම තහවුරු කරගත නොහැකි වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ සහ මිලදී ගත් පුස්තකාල පොත් රු.15,410 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදි යුනොප්ස් (UNOPS) ආයතනයෙන් පරිත්‍යාග ලෙස ලැබී තිබුණු යතුරු පැදිය සහ ලැප්ටොප් පරිගනකයෙහි වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි

(ඈ) අවිනිශ්චිත ගිණුම්
----------------------

2017 දෙසැම්බර් 31 දිනට පැවති අවිනිශ්චිත ගිණුමේ හර ශේෂය රු.714,185 හඳුනාගෙන ගිණුම්වලට ගැලපීම් සිදු නොකර සමුච්චිත අරමුදලට ගැලපීම් කර තිබුණි.

**1.3.2 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම**

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| **(අ)** | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්රෙගුලාසි සංග්‍රහය | |
| (i) | මුදල්රෙගුලාසි 134 (2) | සමලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය විෂයයන් සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන පරීක්ෂණ වැඩසටහනක් පිළියෙල කර නොතිබුණි. |
| (ii) | මුදල්රෙගුලාසි 571 | 2013 සහ 2014 වර්ෂවල විවිධ තැන්පතුවල ශේෂ රු.1,092,730 ක් පැවැති නමුත් එම තැන්පතු ආපසු ලබා දී නිරවුල් කිරීමට හෝ ආදායමට මාරු කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 7**56** | පුස්තකාල පොත් භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයක් විසින් වර්ෂ කිහිපයක සිට සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| (iv) | මුදල් රෙගුලාසි 1645 සහ 1646 | වාහනවලට අදාල සෑම මාසයකම ධාවන සටහන් සහ මාසික සාරාංශ ඊළඟ මාසයේ 15 වැනි දිනට ප්‍රථම විගණකාධිපතිවරයාට ඉදිරිපත් කළ යුතු වුවත්, සභාව විසින් භාවිතා කරනු ලබන වාහනවලට අදාල ධාවන සටහන් සහ මාසික සාරාංශ විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර නොතිබුණි. |
| **(ආ)** | 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සභාව විසින් වාහන සම්බන්ධයෙන් ඉන්ධන පරිභෝජන පරීක්ෂාවක් සෑම වර්ෂයක් සඳහාම සිදුකර නොතිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු.74,268,918කි. ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු.105,689,284 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.31,420,366ක පිරිහීමක් පෙන්නුම් කෙරිණි.

**2.2 මූල්‍ය පාලනය**

**-----------------**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව අතුරු අග්‍රිම ලබාදී අදාළ කාර්යය අවසාන වූ වහාම නිරවුල් කළ යුතු වුවත්, 2013, 2014 සහ 2016 වර්ෂවලදී අවස්ථා 05 කදී විවිධ පුද්ගලයන් හා ආයතනවලට ලබා දී තිබූ රු.607,972 ක අතුරු අග්‍රිම නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

2.3 **ආදායම් කළමනාකරණය**

**--------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) වරිපනම් බදු**

**-------------------**

සභාව විසින් වරිපනම් බදු වශයෙන් 2008 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසාන වන විට අයකර ගත යුතු රු.25,469,851 ක් තුළ සුනාමියෙන් හානියට පත් ප්‍රදේශ සඳහා බදු, ආගමික ස්ථාන සඳහා බදු, රජය විසින් පවරාගනු ලැබූ ප්‍රදේශ සඳහා බදු, ද්වි සටහන් සහ මහනගර සභා දේපල ආදිය සඳහා අයකර ගත යුතු බදු හිඟ මුදල් අන්තර්ගතව පැවතුණි.

(ආ) කුලී අයකිරීම

----------------

2016 වර්ෂයේ කුලී සහ එයට සම්බන්ධිත ආදායම් රු.10,190,688 ක් අයකර ගත යුතු වුවත්, 2017 වර්ෂයේදී මෙම අයකර ගත යුතු ආදායම් රු.16,359,604 ක් දක්වා වැඩි වී තිබීම ආදායම් අයකිරීමේ පිරිහීමක් පෙන්නුම් කෙරුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**-------------------------------**

**3.1 කාර්යසාධනය සමාලෝචනය**

**---------------------------------**

(අ) තිරසාර සංවර්ධන අරමුණු

---------------------------------

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටවල රාජ්‍ය නායකයින්ගේ නායකත්වයෙන් 2015 වර්ෂයේ තිරසර සංවර්ධන සම්මේලනයේ තීරණය අනුව සභාව විසින් 2030 වර්ෂයේ ළඟාකරගත යුතු තිරසාර සංවර්ධන වැඩසටහන් න්‍යාය පත්‍රය සම්බන්ධයෙන් මැනිම සඳහා දර්ශකයන් ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) නොනිමි වැඩ

-----------------

රු.මිලියන 227 ක ඇස්තමේන්තු වටිනාකමකින් ආරම්භ කළ මහජන පුස්තකාල ගොඩනැගිල්ල සඳහා 2011 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා රු.74,752,383 ක් වැය කර තිබුණි. මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම් කටයුතු අතරමඟ නවතා දමා තිබූ අතර මෙම ගොඩනැගිල්ල ඉදිකිරීමේ කාර්යයන් අවසන් කිරීම සඳහා සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සභාව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. ගොඩනැගිල්ල වර්ෂ 04 කින් හෝ 05 කින් ඉදිකර අවසන් නොවුවහොත් එහි ශක්තිමත්භාවය හීන වී යාමට ඇති අවස්ථා බහුලය.

(ඈ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

----------------------------------

තිරුප්පෙරුන්තුරෙයි ස්ථානය ඝන අපද්‍රව්‍ය වළලනු ලබන ස්ථානයක් වශයෙන් සභාව විසින් භාවිතයට ගනු ලබමින් පවතින නමුත්, එම ඉඩම නීත්‍යානුකූලව ලබාගෙන නොතිබුණි. තවද, මධ්‍යම පරිසර අධිකාරියේ අවසරයකින් තොරව තිරුප්පෙරුන්තුරෙයි හි මලඅපද්‍රව්‍ය බැහැර කිරීම නිසා ඉන් පිටවන අපජලය පිරිපහදු නොකර පරිසරයට මුදාහැරීම නිරීක්ෂණය විය.

(ඇ) මාතෘ ළදරු සුභසාධනය සහ සෞභාග්‍ය පවත්වාගෙන යාම

-------------------------------------------------------------------

2017 වර්ෂයේ මඩකලපුව සෞඛ්‍ය වෛද්‍ය අධිකාරී කාර්යාලයේ තොරතුරු අනුව, සභා බල ප්‍රදේශයේ ඉපදුනු ළදරුවන් 1,290 කගෙන් ළදරුවන් 137 (10.6%) බරින් අඩු දරුවන් ලෙස ඉපදී තිබුණි. එසේ වුවත්, සභාවේ අයවැය සැලැස්මේ මාතෘ ළදරු සුභසාධනය වෙනුවෙන් රු.250,000 ක් ප්‍රතිපාදන වෙන්කර තිබූ නමුත් සභාව විසින් ඉහත සඳහන් සැලැස්ම වෙනුවෙන් වැයකර නොතිබුණි. එසේම 2014, 2015 සහ 2016 වර්ෂවලදී පිළිවෙලින් 109 ක්, 136 ක් සහ 98 ක් වශයෙන් අඩු බර ළදරුවන් ඉපදී තිබුණත්, සභාව විසින් අයවැය සැලැස්මෙන් ඉහත විෂයය වෙනුවෙන් ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඉ) මගී ගමනාගමන නැවතුම්පොළ

---------------------------------

සභා බල ප්‍රදේශයේ මඩකලපුව A15 මාර්ගයේ 7km අතර මැද, කල්ලඩි සහ විපුලානන්ද සංගීත නැටුම් විද්‍යාලය ආදී ස්ථානවල මාර්ග සංවර්ධන අධිකාරිය විසින් මගීන් බස් රථ සඳහා නැවතී සිටීමේ ස්ථානයක් ලෙස පෙන්වා දුන් ස්ථානයට ඉදිරියෙන් බස් රථ සඳහා මගීන් නැවතී සිටීමේ නැවතුම්පොළ ඉදිනොකර සභාව විසින් 6m ක් පමණ නුදුරින් නැවතුම්පොළ ඉදිකර තිබූ බැවින් මගීන් සහ බස්රථ රියදුරන් විවිධ දුෂ්කරතාවයන්ට මුහුණ පා සිටිති.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා සේවය අත්හිට වූ සේවකයින් 05 දෙනෙකු සහ විශ්‍රාම ගිය සේවකයින් 08 දෙනෙකුගේ හිඟ ණය පිළිවෙලින් රු.265,678 ක් සහ රු.337,251 ක් ඔවුන්ගෙන් අයකර ගැනීමට හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) මහනගර නේවාසිකාගාර අලුත්වැඩියාව

සභාවේ නේවාසිකාගාර 03 ක සුළු අළුත්වැඩියාවන් තිබුණද ඒවා අලුත්වැඩියා කිරීමට ක්‍රියාමාර්ග නොගෙන පිළිවෙලින් 2015 මාර්තු, 2017 පෙබරවාරි සහ 2017 මාර්තු කාලපරිච්ඡේදයේ සිට කිසිවෙකුටත් භාර නොදී නිෂ්කාර්යව පැවතුණු අතර නේවාසිකාගාර තුනම කුලියට ලබා නොදීම හේතුවෙන් සභාවට ලබාගත හැකි ආදායම් සභාව අහිමි කරමින් තිබුණි. තවද, අලුත්වැඩියා කර භාවිතා නොකිරීම නිසා නිකරුනේ පවතින ස්ථානවල මදුරුවන් බෝවීම අධික වීම නිසා සභාව වනාහි වක්‍රව මදුරුවන් බෝවීම සඳහා සහාය දිය හැකි අවස්ථා පැවතුණි.

(ඇ) නැගෙනහිර පළාත්, පළාත් පාලන කොමසාරිස්වරයා විසින් සලසා තිබූ පළාත් සංවර්ධන පරිත්‍යාග වැඩසටහන් යටතේ තිරුප්පෙරුන්තුරෙයිහි Night Soil Treatment Plant ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් බවට වාර්තා සකස් කර 2015 දෙසැම්බර් 31 දින රු.1,000,000 ක් ලබාගෙන තිබූ

නමුත්, රු.320,000 ක් සඳහා වන යකඩ ගේට්ටු, විදුලි සම්බන්ධතා සහ ජලය සැපයීමේ කාර්යයන් සම්පූර්ණ කර නොතිබුණි.

(ඈ) 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා ඉටුකළ කාර්යයන් සඳහා වූ ඇප මුදල් රු.3,060,985 ක් කොන්ත්‍රාත්කරුවන්ට ආපසු ලබාදීමට හෝ සභා ආදායම් ගිණුමට මාරුකිරීමට හෝ කටයුතු නොකර තැන්පත් ගිණුමේ දක්වා තිබුණි.

(ඉ) වාහන නැවතුම්පොළ බදු දීම

සභාව විසින් 2017 ජනවාරි 01 දින මත්තියාස් මාර්ගයේ යතුරු පැදි ත්‍රීරෝද රථ සඳහා ආරක්ෂක බදු අයකිරීම වෙනුවෙන් රු.1,910,999 කට බදු දී තිබුණි. බදු ගිවිසුමේ 05 වැනි වගන්තිය ප්‍රකාර මත්තියාස් මාර්ගය හැර අනෙකුත් මාර්ගවල වාහන නැවැත්වීම සහ බදු අයකිරීම සම්පූර්ණයෙන් තහනම් කර තිබුණත්, 2017 ඔක්තෝබර් 06 දින සිදු කළ ක්ෂේ ත්‍ර පරීක්ෂාවේදි සහ මේ දක්වා මෙයට පටහැනිව අනෙකුත් මාර්ගවල නවත්වනු ලබන වාහනවලින්ද බදු අයකරමින් පැවතුණි.

(ඊ) සභාවට අයත් ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම් මේ දක්වා තක්සේරු කර ඒවා මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. මේ හේතුව නිසා සභාව සතු වටිනා ඉඩම් හා ගොඩනැගිලි කුලියට හෝ බද්දට දීමේදී ආදායමේ ප්‍රමාණය නිවැරදිව තක්සේරු කිරිමට නොහැකි වීම මෙන්ම වාර්ෂික ආදායම්ද වැඩිකර අයකිරීමට නොහැකි වී තිබුණි.

**3.3 වත්කම් කළමනාකරණය**

**3.3.1 වත්කම් සමීක්ෂණ වාර්තා**

සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ සඳහන් ආකාරයට ඉවත් කළ යුතු භාණ්ඩ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කිරීම සඳහා කමිටු ස්ථාපිත කර ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

**3.4 කොන්ත්‍රාත් පරිපාලනය**

**3.4.1 රාත්‍රී පොළ ඉදිකිරීම**

මහනගර සභාව විසින් නෙල්සිප් සැලැස්ම යටතේ රාත්‍රී කාල වෙළඳපොල අවස්ථා ඇතිකිරීම සඳහා 2016 වර්ෂය දක්වා එකතුව රු.30,950,689 ක වටිනාකමකින් යුත් ගොඩනැගිල්ලක් ඉදිකර තිබූ නමුත් මේ දක්වා භාවිතා කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**3.4.2 ඉදිකිරීම් සහ නඩත්තු කිරීම සඳහා වන පාලනය**

සමාලෝචිත වර්ෂයේ සභාවේ ප්‍රතිපාදන සහ සහනාධාර මඟින් සභාව විසින් කර්මාන්ත දෙපාර්තමේන්තුවෙන් සිදුකරන ලද සෑම කර්මාන්තයක් සඳහාම වැඩ පත්‍රිකාවක් (Job Sheet) සකස් කර නොතිබුණි. ඒ සමඟම අදාළ සෑම කාර්යයක් වෙනුවෙන්ම ලබා දී තිබූ අමුද්‍රව්‍ය සහ අනෙකුත් වියදම් අදාළ කාර්යයන් වෙත පැවරීම සිදුකර නොතිබුණි.

**4.** **ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1** **අයවැය පාලනය**

මූලධන හා පුනරාවර්තන වියදම් සඳහා ඇස්තමේන්තු කළ වටිනාකමට සහ තථ්‍ය වියදම අතර 15% සිට 64% දක්වා පරාසයකින් විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය වනාහි කළමනාකරණ පාලන කාරකයක් ලෙස භාවිතා කර නොතිබුණු බව අනාවරණය විය.

**5.** **පද්ධති හා පාලන**

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

| පාලන ක්ෂේත්‍රය | විශේෂ අවධානය යොමු කළ යුතු විෂයයන් |
|---|---|
| (අ) ආදායම් කළමනාකරණය | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කිරීම. |
| (ආ) අයවැය පාලනය | අයවැය පිළියෙල කිරීමේදී අදාල විෂයයන් සමාලෝචනය කිරීම සහ අවධානය යොමුකිරීම සිදුකළ යුතුය. |
| (ඇ) ගිණුම්කරණය | ලෙජර් ගිණුම් දෛනිකව නිසි පරිදි පවත්වාගෙන යාම. |
| (ඈ) ස්ථාවර වත්කම් පාලනය | (i) ස්ථාවර වත්කම් ලේඛන පවත්වා ගැනීම<br>(ii) නිෂ්කාර්යව පවතින ස්ථාවර වත්කම් භාවිතා කිරීමට ක්‍රියාමාර්ග ගැනීම. |
| (ඉ) ගබඩා | ගබඩා තොගයේ වටිනාකම සඳහා සත්‍ය වශයෙන් පැවැති වත්කම්වල වටිනාකම තක්සේරු කර එහි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |